# නව කළමනාකරණ ප්‍රවේශයක් ලෙස පුරවැසි ප්‍රඥප්තියේ ඵලදායිත්වය : ජා-ඇල නගර සභාව ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***යූ.එල්.එච්.ඩී. පෙරේරා [1]***
***එම්.කේ. නදීකා දමයන්ති [2]***

---

**සංක්ෂේපය**

නූතනයේ බොහෝ රාජ්‍යයන්හි කාර්යක්ෂම, මිත්‍රශීලි සහ ඵලදායී රාජ්‍ය සේවයක් බිහිකර ගැනීමේ අරමුණින් නව කළමනාකරණ ප්‍රවේශ භාවිත කරනු ලබයි. මෙකී ප්‍රවේශ අතර 2007 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් හඳුන්වාදෙන ලද පුරවැසිසේවා ප්‍රඥප්තිය වැදගත් කොට සැලකිය හැක. 2009 සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ පුරවැසි ප්‍රඥප්ති වැඩසටහන සංවර්ධනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට සහයෝගය දෙනු ලැබේ. මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ, නව කළමණාකරණ ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කිරීමට වෙරදරන පුරවැසි ප්‍රඥප්තියේ ප්‍රතිඵලදායීභාවය හා පුරවැසි ප්‍රඥප්තිය මඟින් කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් සැපයීමට බලපාන සාධක කවරේද යන්න විමසීමයි. ජා-ඇල නගරසභාව කේන්ද්‍ර කොට ගෙන මෙම අධ්‍යයනය සිදු කරනු ලැබිණි. අධ්‍යයන ප්‍රදේශය අහඹු ලෙස තෝරාගත් අතර නියැදිය තෝරා ගැනීමේදී නගරසභාවේ සේවා දායකයින්ගෙන් 100ක් ඊට ඇතුළත් විය. අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතීයික දත්ත යොදාගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීමේදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රමවේද උපයෝගී කර ගැනිණි. රැස්කර ගත් ප්‍රාථමික දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රතිශත, ප්‍රස්තාර සහ වගු සටහන් වැනි සරල සංඛ්‍යානමය ක්‍රමවේද භාවිත කළ අතර ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරමින් විශ්ලේෂණය කෙරිණි. අධ්‍යයනයෙන් අනාවරණයවූ මූලික කරුණු වන්නේ, පුරවැසි ප්‍රඥප්තියේ ඵලදායීභාවය කෙරෙහි බලපාන මහජනතාව ඒ සම්බන්ධයෙන් දක්වන දැනුවත්භාවය ඉතා සීමිත බවයි. එහිදී, සසම්භාවී ලෙස තෝරාගත් 100 කින් යුක්ත නියැදියෙන් 96%ක් ඒ පිළිබඳ දැනුවත් නොවිණ. එසේම, පුරවැසි ප්‍රඥප්තිය මඟින් කාර්යක්‍ෂම හා සඵලදායී සේවාවක් සැපයීම උදෙසා බලපාන සාධක වන පුරවැසි චෝදනා පෙට්ටිය සම්බන්ධයෙන් සේවාලාභීන් 97% ක් දැනුවත් නොවීම තුළින් මෙන්ම ආයතනික දැක්ම, මෙහෙවර පිළිබඳව සේවාලාභීන් 96% ක් දැනුවත් නොවීම මඟින් එම සාධක සාර්ථක මට්ටමින් ජා-ඇල නගර සභාව තුළ ක්‍රියාත්මක නොවන බව අනාවරණය විණ. ඒ අනුව නිරීක්ෂණවලින් හෙළි වූ කරුණවන්නේ, ජා-ඇල නගර සභාව පුරවැසි ප්‍රඥප්තිය තම කාර්යාලීය පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කරමින් රජයේ ප්‍රතිපත්තියට අනුගත වුවත් ප්‍රායෝගිකව එය ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් හෝ විධිවිධාන සලසා නොමැති බවයි.

**ප්‍රමුඛ පද : පුරවැසි සේවා ප්‍රඥප්තිය, ජා ඇල නගර සභාව, නව කළමණාකරණ ප්‍රවේශ, රාජ්‍ය සේවය, නිලධාරින්**

---

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.